(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 161.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ජූලි 07 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

766/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීත්‍යානුකූලව පොලිස් ආරක්ෂාව ලැබීමට හිමිකම් ඇති තනතුරු සහ එම තනතුරු දරන පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පොලිස් ආරක්ෂාව ලබාගැනීමට හිමිකම් නොමැති පුද්ගලයන් සහ ආයතන සඳහා ද පසුගිය කාලයේ පොලිස් ආරක්ෂාව යොදා තිබූ බව මාධ්‍ය මඟින් පෙන්වාදී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් වන තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

774/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු කොරියාවේ E-8 වීසා කාණ්ඩය යටතේ රැකියා අවස්ථා ලබාදීම සම්බන්ධයෙන් ප්‍රශ්නගත තත්ත්වයක් ඇතිවූ බව දන්නේද;

(ii) එසේ නම්, එම රැකියා අවස්ථා ලබාදීම විධිමත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) අදාළ රැකියා අවස්ථා ලබාදීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

844/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා නේවාසික පුහුණුවක් ලබා නොදී ගෘහ සේවය සඳහා විදේශ ගත කරන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් විදේශ ගතවූ රටවල් කවරේද;

(iii) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත අනුව ගෘහ සේවය සඳහා විදේශ ගත වන ශ්‍රී ලාංකිකයන්ට නේවාසික පුහුණුවක් ලබා දීම අනිවාර්ය කර තිබෙන බව දන්නේද;

(iv) 2020 වර්ෂයේ සිට මේ දක්වා නේවාසික පුහුණුවක් ලබා නොදී ගෘහ සේවය සඳහා ශ්‍රී ලාංකිකයන් විදේශ ගත කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අහිමිවූ ආදායම කොපමණද;

(v) ගෘහ සේවය සඳහා විදේශ ගත වන සියලු ශ්‍රී ලාංකිකයන්ට නේවාසික පුහුණුවක් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

884/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරළේපත්තුව, වාලච්චේනෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ ඉහත කාලය තුළ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් සමහර පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1019/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රාජ්‍ය සේවයේ නියුතු සංවර්ධන නිලධාරින් සහ කළමනාකරණ සේවා නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) දෙපාර්තමේන්තු සහ පළාත්වලට සංවර්ධන නිලධාරින් බෙදී යාම පිළිබඳව මෑතකදී සමාලෝචනයක් සිදුකර තිබේද;

(iii) එසේ නම්, එහි ප්‍රධාන සොයාගැනීම් කවරේද;

(iv) සංවර්ධන නිලධාරි සේවයට තවමත් විධිමත් ලෙස අනුමත කරන ලද සේවා ව්‍යවස්ථාවක් නිකුත් කර නොමැතිද;

(v) එසේ නම්, එවැනි ප්‍රමාදයකට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1031/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(ii) එම අධිකාරිය සඳහා අනුමත කර ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට සිටින සේවකයින් සංඛ්‍යාව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) අපයෝජනයට ලක්වන ළමුන් සම්බන්ධයෙන් අධිකාරිය සතුව නීතිමය බලයක් තිබේද;

(v) එසේ නම්, එම නීතිමය බලය ක්‍රියාත්මක කරන ආකාරය කවරේද;

(vi) එම ආයතනය ශක්තිමත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1249/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පස් පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iii) පස් පරීක්ෂා කිරීමේ අරමුණ කවරේද;

(iv) පස් පරීක්ෂා කිරීම සඳහා මේ වනවිට ස්ථාපිත කර ඇති විද්‍යාගාර සංඛ්‍යාව කොපමණද;

(v) ඒවා ස්ථාපිත කර ඇති ස්ථාන කවරේද;

(vi) 2024 වර්ෂයේ සිට මේ දක්වා පරීක්ෂා කර ඇති පස් සාම්පල් සංඛ්‍යාව, එම පස් සාම්පල් ලබා ගෙන ඇති ස්ථාන අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1318/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍යවරුන් 2500කට අධික සංඛ්‍යාවක් දීර්ඝ කාලයක සිට රජයේ පත්වීම් ලබා ගැනීමට නොහැකිව සිටින බවත්;

(ii) 2023 වර්ෂයේදී ලබා දෙන ලද ආයුර්වේද වෛද්‍ය පත්වීම් 61ක් තුළ යුනානි වෛද්‍යවරුන් සඳහා පත්වීම් ලබා නොදීම හේතුවෙන් යුනානි වෛද්‍යවරුන්ට අසාධාරණයක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත (අ)(i)හි සඳහන් ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා රජයේ පත්වීම් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1375/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින හීළෑ අලි-ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලි-ඇතුන් හිමියන්ගේ නම් සහ ලිපින කවරේද;

(iii) එම අලි-ඇතුන් සන්තකයේ තබා ගැනීම සඳහා බලපත්‍ර ලබාදීමේදී සලකා බලනු ලබන කරුණු කවරේද;

(iv) එම අලි-ඇතුන් සම්බන්ධයෙන් පසු විපරමක් හා නිරන්තර සොයා බැලීමක් සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ඇති යාන්ත්‍රණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1803/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල, වර්ගීකරණය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම දිස්ත්‍රික්කයේ තැපැල් දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් හා ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් සහ පිහිටි ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම දිස්ත්‍රික්කයේ තැපැල් කාර්යාල ස්ථිරව හෝ තාවකාලිකව වසා දැමීමට තීරණය කර තිබේද;

(v) මේ වනවිටත් ඇතැම් තැපැල් කාර්යාල වසා දමා ඇති බව දන්නේද;

(vi) එසේ නම්, එයට හේතු කවරේද;

(vii) මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(viii) දිස්ත්‍රික්කයේ තැපැල් සේවාව යථා තත්ත්වයට පත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ix) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අකුරැස්ස තැපැල් ස්ථානාධිපතිවරයාගේ පරිපාලන දුර්වලතා සම්බන්ධයෙන් වාර්තාවී තිබේද;

(ii) ඔහුට එරෙහිව සේවකයින් විරෝධතාවල නිරත වන බව දන්නේද;

(iii) ඔහුට එරෙහිව විනයානුකූල පියවර ගෙන තිබේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥා පනත යටතේ නියෝග,— (188 අධිකාරය වූ) පුරාවස්තු ආඥා පනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47 වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2026 අප්‍රේල් 11 දින සාදන ලදුව, 2026 ජූනි 12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— දූෂණ විරෝධී පනත යටතේ නියෝග (අංක 1),— 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 82 වගන්තිය සහ 92 වගන්තිය සමඟ කියවිය යුතු 156 වගන්තිය යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විමසා, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මාර්තු 30 දිනැති අංක 2482/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— දූෂණ විරෝධී පනත යටතේ නියෝග (අංක 2),— 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80 වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය සමඟ කියවිය යුතු එකී පනතේ 156 වගන්තිය යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විමසා, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මාර්තු 30 දිනැති අංක 2482/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ නියෝග,— 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 11 වගන්තිය සමඟ කියවිය යුතු 17 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 දෙසැම්බර් 23 දිනැති අංක 2468/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය,— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධව 2026.06.24 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2026 මාර්තු 03 දිනැති අංක 2478/03 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 141, 143, 144, 157අ, 168 සහ 190 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මාර්තු 19 දිනැති අංක 2480/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියමය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ ද එකඟතාවය ඇතිව, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 03 දිනැති අංක 2478/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියමය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ අය කළ යුතු සහ ගෙවිය යුතු සෙස් බදු අනුප්‍රමාණයන් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ ද එකඟතාවය ඇතිව, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 10 දිනැති අංක 2479/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ තීරණය (අංක 1),— "විදේශ ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට අදාළව 2022 මැයි 01 දින සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය" පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2025.04.02 දින සිදුකරන ලද පරීක්ෂණ සම්බන්ධයෙන් කරුණු ඇතුළත් 2025 ඔක්තෝබර් 24 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 318 දරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4)හි විධිවිධාන ප්‍රකාරව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

*13.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ තීරණය (අංක 2),— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අදාළ ආයතන සම්බන්ධයෙන් එකී කාරක සභා රැස්වීම්වල දී සිදු කරන ලද විමර්ශනවලට අදාළව සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවන්හි ඇතුළත් වාර්තා මඟින් හඳුනාගත් මෙහි පහත ඇමුණුමේ සඳහන් සිද්ධි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4)හි විධිවිධාන ප්‍රකාරව නිසි පියවර ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි:—

**ඇමුණුම**

| **අනු අංකය** | **ආයතනය** | **කාරක සභා රැස්වීම පැවැත්වූ දිනය** | **වාර්තාව සභාගත කළ දිනය හා පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය** | **නිශ්චිත සිද්ධිය/සිද්ධි** |
|---|---|---|---|---|
| 1. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.05 හා 2025.03.27 | 2025.06.04 PS 212 | 1. කිලෝ ග්‍රෑම් 510ක් බර "Rough Sapphire Cluster" මැණික් පාෂාණය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 2. හෙරණියාවක මැණික් ඉල්ලම ඉවත් කර ගැනීම සඳහා වන ව්‍යාපෘතිය. |
| | | | | 3. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට නව ගොඩනැගිල්ලක් කුලියට ගැනීම. |
| 2. | ශ්‍රී ජයවර්ධනපුර මහරෝහලාශාලා මණ්ඩලය | 2025.05.15 | 2025.07.24 PS 242 | 1. විදුලි පද්ධතියේ ආරක්ෂාවට ගෙන් වූ උපකරණ ප්‍රධාන පද්ධතියට සම්බන්ධ කිරීම. |
| | | | | 2. දීමනා ගෙවීම්වල අක්‍රමිකතා සහ බඳවා ගැනීම් පටිපාටිය. |
| | | | | 3. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු සඳහා බඳවා ගැනීම. |
| 3. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.05.08 හා 2025.07.17 | 2025. 12.18 PS 391 | 1. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා අරමුදලෙන් කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා මුදල් වියදම් කිරීම. |
| | | | | 2. එස්. ආර්. රෙන්ගනාදන් මහතාට ඉඩම් ලබාදීම (මාතලේ බෙගෲප් වත්ත). |
| | | | | 3. මාලනී නානායක්කාර මහත්මියට ඉඩම් ලබාදීම (ඉඹුල්ගස්වාඩිය, කටාන) |
| | | | | 4. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයන්ට ඉඩම් ලබාදීම. |

| | | | | |
|---|---|---|---|---|
| 4. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 2025.06.04 | 2025.12.18 PS 392 | 1. විශ්වවිද්‍යාලයේ නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම. |
| | | | | 2. විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා නිවාස සංකීර්ණයක් ඉදි කිරීමේදී සිදුවූ අක්‍රමිකතා. |
| | | | | 3. 2021 වර්ෂය තුළ තාක්ෂණ පීඨය සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීම. |
| | | | | 4. විශ්වවිද්‍යාල භූමියෙන් අනවසරයෙන් පස් කැපීම. |
| | | | | 5. උපකුලපතිවරයාට අයිතිව තිබූ නිවසක් බදු පදනම මත ශිෂ්‍ය නේවාසිකාගාරයක් සඳහා ලබාදීම. |
| 5. | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය | 2025.08.20 | 2025.12.18 PS 394 | 1. වීරවිල සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම. |
| 6. | ලංකා සතොස ලිමිටඩ් | 2025.10.10 | 2025.12.18 PS 397 | 1. සේවක දිරි දීමනා ගෙවීම. |
| | | | | 2. කිලිනොච්චිය නගරයේ පිහිටි සමාගම සතු වර්ග අඩි 15000ක ගොඩනැගිල්ල බදු පදනමට ලබාදීම. |
| | | | | 3. කාර්ය සාධන දීමනා හා වෘත්තීය දීමනා. |
| | | | | 4. ප්‍රවාහන දීමනා. |
| 7. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.02.27 හා 2025.05.23 | 2026.01.08 PS 435 | 1. නේවාසික පුහුණුවක් ලබාදීමකින් තොරව ගෘහ සේවිකාවන් විදේශගත කිරීම නිසා කාර්යාංශයට අලාභයක් සිදුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 2. විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරින් පත් කිරීම |
| | | | | 3.“Glocal Fair” (ජයගමු ශ්‍රී ලංකා) වැඩසටහන. |
| | | | | 4.“Glocal Fair” (ජයගමු ශ්‍රී ලංකා) වැඩසටහන වෙනුවෙන් වෙළඳ කුටි ලබා ගැනීම. |
| | | | | 5.“විගමණික හරසර” වැඩසටහන පැවැත්වීම. |
| 8. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.19 හා 2025.11.26 | 2026.02.19 PS 476 | 1.බිම්පුත් ෆිනෑන්ස් සමාගමට (Bimputh Finance PLC) ණය ලබා දීම. |
| | | | | 2.පුද්ගලයන් දෙදෙනෙකු වෙත 2020 දෙසැම්බර් 23 දින ලබා දී ඇති රු. මිලියන 164.73 ක් වූ බද්ධ දේපළ ණය. |
| | | | | 3.ණය තොරතුරු කාර්යාංශ වාර්තාවේ සඳහන් ණය පහසුකම් 10ක අක්‍රමවත් ආපසු ගෙවීම් සලකා බැලීමකින් තොරව ණය ගැණුම්කරුවෙකුට රු. මිලියන 12.6ක ණයක් ලබා දීම. |
| | | | | 4.ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් RPI Private Limited නැමැති මාලදිවයින් සමාගමක් වෙත ලබාදී ඇති එක්සත් ජනපද ඩොලර් මිලියන 9ක් වටිනා සම්මේලනික ණය. (Syndicate Loan) |

*14.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*17.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

20.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

21.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

22.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

23.

කෝද්දාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

896/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් ඇතැම් පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

897/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?